**ජාතික මූලික අධ්‍යයන ආයතනය - 2018**

----------------------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික මූලික අධ්‍යයන ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව, මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ජාතික මූලික අධ්‍යයන ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුවේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

------------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් ‘‘මනාලෙස සැලසුම් කරන ලද’’ අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.5.2 ශ්‍රී ලංකා ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි ඡේදය 99 අනුකූල නොවන පරිදි ආයතනයේ විවිධ ව්‍යාපෘති 29 ක සහ වැඩසටහන් හා වැඩමුළු 12 ක සමාලෝචිත වර්ෂයට අදාළ රු.32,116,648 ක ආදායම් සහ රු.17,659,343 ක වියදම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ සටහන් නොකර එයින් වර්ෂය තුළ දරන ලද රු.15,498,385 ක් වූ පුනරාවර්තන වියදම් පමණක් වර්ගීකරණය නොකර, වියදම් හා ආදායම් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා තිබුණි. | සමාලෝචිත වර්ෂයේ ලද මුදලින් දරන ලද පුනරාවර්තන වියදම් රු.15,498,385 ක මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ආදායම් ලෙස හා වියදම් ලෙසද, ප්‍රාග්ධන වියදම් රු.2,160,958 ක අගය ශුද්ධ වත්කම් වෙනස් වීම් ප්‍රකාශයේද, ඉතිරි ශේෂ රු.25,679,920 විශේෂිත අරමුදල් හා ප්‍රදාන ලෙස හිමිකම් යටතේද ගිණුම්ගත කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 හි 24 (අ) ඡේදයට අනුකූල නොවන පරිදි ආයතනයට පරිත්‍යාග ලෙස ලද ස්ථාවර වත්කම් සමාලෝචිත වර්ෂයේ ක්‍රමක්ෂය කිරීම සඳහා නව ප්‍රතිපත්තියක් හඳුනාගෙන තිබුණද, මෙම ප්‍රතිපත්තිය හෙළිදරව් කර හෝ අතීතානුයෝගීව ගැලපීම් කර හෝ නොතිබුණි. | ආයතනයට පරිත්‍යාග ලෙස ලද ස්ථාවර වත්කම් වෙන්ව හඳුනා ගැනීමේ ප්‍රායෝගික අපහසුතාවය නිසා, අතීතානුයෝගීවන ගැලපීම් සමාලෝචිත වර්ෂයේදී සිදුකර නොමැත. එහෙත් ඉදිරියේදී අදාළ ගැලපීම් සිදුකිරීමට හා අදාළ ප්‍රතිපත්තිය හෙළිදරව් කිරීමට සටහන් තබා ගන්නා ලදී. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 75 ඡේදයට අනුකූල නොවන පරිදි ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.123,805,941 ක් වූ ජංගම නොවන වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. | ආයතනයේ ජංගම නොවන වත්කම්වල ප්‍රත්‍යාගණන කටයුතු මේ වනවිට සිදුකරමින් පවතී. එම ප්‍රත්‍යාගණන වාර්තාවලට අනුව අදාළ ගැලපීම් සිදුකරනු ලැබේ. ඒ අනුව තව දුරටත් භාවිතයට ගනු ලබන ජංගම නොවන වත්කම් අගයන් ප්‍රතිශෝධනය වනු ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ රාජ්‍ය ප්‍රදාන මඟින් මිලදී ගත් රු.75,180,691 ක් වටිනා වත්කම් සම්බන්ධයෙන් හා ඉකුත් වර්ෂයන්හී දී අත්පත් කර ගෙන තිබූ වත්කම්වලට අදාළව සමාලෝචිත වර්ෂයේ ක්‍රමක්ෂය වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කිරීමට හා ඊට අදාළ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන මගින් මිලදී ගත් වත්කම් සඳහා වන ක්ෂය ප්‍රමාණයට අනුරූප ප්‍රමාණයක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ක්‍රමක්ෂය වශයෙන් වාර්ෂිකව ඉදිරියේදී ගැලපීම් කිරීමට හා අදාළ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනයේ හෙළිදරව් කිරීමට සටහන් තබාගන්නා ලදී. | වර්ෂයට අදාළ ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රත්‍යාගණන සංචිතයේ ශේෂය රු.118,388,385 ක් වී තිබූ අතර ප්‍රත්‍යාගණන සංචිතය සම්බන්ධයෙන් ආයතනයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට සටහන් තබා ගන්නා ලදි. | ප්‍රත්‍යාගණන ගැලපීම් අදාළ ප්‍රතිපත්තීන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

### 1.5.4 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගත් රු.29,853,300 ක් වටිනා භාවිතයට ගත නොහැකි වත්කම් හා රු.6,037,985 ක් වටිනා අස්ථානගත වූ වත්කම් ජංගම නොවන වත්කම් තුළ ඇතුළත්ව තිබුණි. | භාවිතයට ගත නොහැකි වත්කම් වෙන්දේසි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින අතර, අස්ථාන ගතවූ භාණ්ඩ සොයා ගැනීම පිණිස අනු භාණ්ඩ ලැයිස්තු (Sub inventory lists) නඩත්තුව ආරම්භ කර ඇත. ඉන් අනතුරුවද සොයා ගැනීමට නොහැකි භාණ්ඩ සම්බන්ධව අවශ්‍ය කටයුතු ඉදිරියේ දී සිදුකිරීමට නියමිතය. | සියලුම ස්ථාවර වත්කම් විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයකට ඇතුළත් කර යාවත්කාලීනව පවත්වා ගෙන යා යුතුය. |

**1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

**-----------------------------------------**

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ------- | --------- | --------------- | ------------------------- | -------------- |
| | රු. | | | |
| ස්ථාවර වත්කම් | 936,095,460 | ලේඛන | මූලික පියවර ලෙස, ආයතනයේ ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය සිදුකරමින් පවතින බව. | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගත යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

**---------------------------------------------------------------------------**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| -------------------- | | ------------------ | --------------------- | -------------- |
| (අ) | මුදල් රෙගුලාසි 102 | භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගත් රු.10,219,134 ක් වටිනා අස්ථානගත වූ භාණ්ඩ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අස්ථානගත වූ භාණ්ඩ සොයා ගැනීමට කටයුතු කරමින් පවතින අතර සොයා ගැනීමට නොහැකි භාණ්ඩ සම්බන්ධව අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කිරීමට නියමිතය. | මුදල් රෙගුලාසි 102 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 770(2) | 2017 දෙසැම්බර් 31 දිනට සිදු කර තිබූ භාණ්ඩ සමීක්ෂණයේදී පොදු ආකෘති පත්‍ර භාවිත නොකිරීම හේතුවෙන්, භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල විසින් සිදුකළ යුතු නිර්දේශයන් වාර්තාව තුළ දක්වා නොතිබුණි. | 2018 වසරේ සිට භාණ්ඩ සමීක්ෂණය සඳහා රජයේ පොදු ආකෘති පත්‍ර භාවිත කරනු ලැබේ. | මුදල් රෙගුලාසි 770 (2) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය | ආයතනය විසින් 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2019 අගෝස්තු 20 දිනදීය. | ආයතනයේ සභාපති ධුරය 2019 වසරේ ජූලි මස 23 වන දින තෙක් පුරප්පාඩුව පැවතීම. | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 14(1) වගන්තිය | ඉකුත් වර්ෂයට අදාළව අවසන් වාර්ෂික වාර්තාව හා සමාලෝචිත වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණන දිනය වූ 2019 ජනවාරි 29 දින වන විටත් පිළියෙල කර නොතිබුණි. | මෙම කර්තව්‍ය සිදු කරනු ලබන නිලධාරියා සේවයෙන් ඉවත්ව යාම හේතුවෙන්, අනෙකුත් නිළධාරීන් කාර්යාලීය වෙනත් අත්‍යාවශ්‍ය රාජකාරී කටයුතු වල නිරත වන අතර තුර මෙම වාර්තාව සකස් කිරීමට සිදුවීම නිසා අපේක්ෂිත කාල රාමුව තුළ නිම කිරීමට නොහැකි වීම. | වාර්ෂික වාර්තාව පිළියෙල කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු. 104,071,500 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 73,461,847 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 30,609,653 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි. මෙම අඩුවීමට මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වත්කම් ක්‍රමක්ෂය නොගැලපීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වාම ඌනතාවයක් ඇති වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2014 වර්ෂයේ රු.95,817,273 ක් වූ ආයතනයේ දායකය 2018 වර්ෂයේදී රු.117,182,534 ක් වී තිබුණි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

--------------------------------------------------------------

වර්ෂයේ වියදම් ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී විදේශීය හා දේශීය ප්‍රදාන වියදම් සියයට 60 කින් හා වැටුප් හා වේතන සියයට 12 කින් වැඩි වී තිබූ අතර සැපයුම් හා නඩත්තු වියදම් සියයට 25 කින් අඩු වී තිබුණි. තවද පරිත්‍යාග ලෙස ලද ආදායම් සමාලෝචිත වර්ෂයේ සියයට 73 කින් හා විදේශ මුදල් (විනිමය) හුවමාරු ලාභය සියයට 1008 කින් වර්ධනය වී තිබුණු අතර අධිභාර හා නවාතැන් පහසුකම් සැපයීමේ ආදායම් පිළිවෙලින් සියයට 96 කින් හා සියයට 21 කින් අඩු වී තිබුණි.

**2.3 අනුපාත විශ්ලේෂණය**

----------------------

ආයතනයක ජංගම වත්කම් අනුපාතයේ ප්‍රශස්ථ මට්ටම 1:2 ක් ලෙස පැවතිය යුතු වුවත්, ජාතික මූලික අධ්‍යයන ආයතනයෙහි එය 1:15 ක් ලෙස පැවතුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 හඳුනාගත් පාඩු**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනයේ නිලධාරීන් 4 දෙනෙකු විධිමත් අනුමැතියකින් තොරව දෛනිකව දිගන නිල නිවාසවල සිට ආයතනය දක්වා ප්‍රවාහනය වෙනුවෙන් ආයතනයේ වෑන් රථ භාවිතා කිරීම නිසා සමාලෝචිත වර්ෂය තුළ ආයතනයට රු.203,852 ක පාඩුවක් සිදු වී තිබුණි. | රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛ අංක PED 1/2015 අනුව මාසික ප්‍රවාහන දීමනා සහ නිළ වාහන හිමිකම් නොමැති මධ්‍යම මට්ටමේ කළමණාකරුවන් සඳහා ලබා දෙන අතර ඊට අමතරව ඔවුන්ගෙන් මුදලක් අය කර ගැනීමටද ආයතනය කටයුතු කර ඇත. | නිලධාරීන් සඳහා පහසුකම් සැලසීම අදාළ චක්‍රලේඛ හා විධිමත් අනුමැතියක් මත පමණක් සිදු කළ යුතුය. |
| (ආ) | 2013 මාර්තු 18 දින V.W.R. International Ltd. වෙත රසායනික ද්‍රව්‍ය ආනයනය සඳහා ගෙවන ලද රු.55,863 ක් වූ අත්තිකාරම් මුදලක් ආපසු ලබා ගැනීමට හෝ අදාළ භාණ්ඩ ගෙන්වා ගැනීමට කටයුතු නොකර, ජර්නල් සටහන් අංක 476 මඟින් කපා හැර තිබුණි. | මෙම අයිතමයන් මධ්‍යම පරිසර අධිකාරියෙන්ද අවසර පත්‍රයක් දෙන ලද අතර අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙන් අනුමැතිය ඉල්ලනු ලැබුවද, බඩුවල වටිනාකමට වඩා ගබඩා ගාස්තු ගෙවීමට සිදු වී තිබුණි. තවද භාණ්ඩ රේගුවෙන් සොයා ගැනීමට නොහැකි විය. ආයතනයේ පාලක මණ්ඩලය කරුණු පැහැදිලි කිරීමත් අනතුරුව අදාළ ගැලපීම් සිදු කරන ලදී. | මෙවැනි ගනුදෙනු සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කළ යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනය සඳහා පරිගණක මෘදුකාංග පද්ධතියක් සංවර්ධනය කිරීම වෙනුවෙන් රු.660,00 ක අත්තිකාරම් මුදලක් ලබාදී වසර 03 කට අධික කාලයක් ගතවී ඇතත්, කාර්යය නිම කර භාර දීමට අදාළ සේවාදායක ආයතනය අසමත්වී තිබුණි. මෙම ව්‍යාපෘතිය | ගිවිසුමේ 25 පරිච්ඡේදය ප්‍රකාරව ප්‍රමාද ගාස්තු, ඒකාබද්ධ මෘදුකාංග පද්ධතියේ කටයුතු අවසන් වූ පසු ගෙවීම් කටයුතු සිදු කරන විට අය කර ගැනීමට අපේක්ෂිතය. | නිසි ඇගයීමකින් පසු ව්‍යාපෘති ආරම්භ කර ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වෙනුවෙන් සමාලෝචිත වර්ෂය වන විට රු.6,864,960 ක පරිගණක හා උපාංග මිලදී ගෙන තිබුණි. | | |
| (ආ) | අභ්‍යන්තර විගණනය විසින් සමාලෝචිත වර්ෂය තුළ ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ 29 කින් නිවැරදි කිරීමට කටයුතු කර තිබුණේ නිරීක්ෂණ 6 ක් පමණි. | අදාළ නිරීක්ෂණයන් සම්බන්ධව නිවැරදි කිරීමේ කටයුතු කඩිනමින් සිදුකිරීමට සටහන් තබා ගන්නා ලදී. | අභ්‍යන්තර විගණන වාර්තාවල සඳහන් නිර්දේශයන් සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.3 අරමුදල් ඌන උපයෝජනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයන්වල ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදිත රු.94,478,204 ක මුදලක් අදාළ කාර්යයට උපයෝජනය නොතිබුණි.. | සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂවල අදාළ ප්‍රසම්පාදන කාර්යයන් සඳහා ගෙවීම් ප්‍රමාදයන් වන බැවින් 2018.12.01 දින පාලක මණ්ඩල තීරණයන්ට අනුව රු.81,000,000 ක මුදලක් ආයතනය මගින් පවත්වාගෙන යන ජාතික ඉතුරුම් ගිණුම් අංක 1-0015-01-03152 හි තැන්පත් කරන ලදී. එම මුදලින් රු.29,967,390, 2019.09.30 වන විට අදාළ කාර්යයන් වල ගෙවීම සඳහා උපයෝජනය කර ඇත. | ඉදිකිරීම් ව්‍යාපෘතිවලට අදාළව පවතින හා ලැබෙන අරමුදල් කඩිනමින් උපයෝජනය කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |
| (ආ) | පර්යේෂණ සඳහා ලද ප්‍රදානවලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.25,679,319 ක මුදලක් ශේෂ වී තිබූ අතර එයින් පසුගිය වර්ෂයට අදාළ පර්යේෂණ ව්‍යාපෘති 06 ක රු.1,984,035 ක ශේෂයක් උපයෝජනය කර නොතිබුණි. | අදාළ පර්යේෂණ අරමුදල් ශේෂ නිසි පරිදි උපයෝජනය කිරීමට බලාපොරොත්තු වේ. | පර්යේෂණ ව්‍යාපෘති සඳහා ලද ප්‍රතිපාදන ගිවිසුම් ප්‍රකාරව උපයෝජනය කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |

### 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය
-----------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කර 2018 දෙසැම්බර් 29 දින පාලක මණ්ඩලය විසින් අනුමත කර තිබූ අතර ප්‍රසම්පාදන කටයුතුවල සමස්ථ ප්‍රගතිය සියයට 56 කි. | 2018 වසරේදී ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කිරීමට හේතු වූ කරුණු සහ දුර්වලතා සොයා බලා 2019 වසරේදී වර්ෂය අවසානය වන තෙක් නොසිට වර්ෂය මධ්‍යයේ අදාල සැලැස්ම සංශෝධනය කොට නිසි අනුමැතිය ලබා ගැනීමට සටහන් තබා ගන්නා ලදී. | වාර්ෂික සැලසුම් ඵලදායී පාලන කාරක ලෙස යොදා ගත හැකි වන පරිදි ඒවා පිළියෙල කිරීම, අනුමත කිරීම හා ක්‍රියාත්මක කිරීම කළ යුතුය. |
| (ආ) ප්‍රසම්පාදනය සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබෙන බව තහවුරු කර ගැනීම පූර්ව ප්‍රසම්පාදන ක්‍රියාවලියේ කොටසක් වුවද, ජාතික මූලික අධ්‍යයන ආයතනය භාණ්ඩ ඇණවුම් කරන අවස්ථාවේදී මූල්‍ය හැකියාව තහවුරු කර නොගැනීම හේතුවෙන් වර්ෂය තුළ රු.9,261,310, US$ 2,697 හා CHF 76,330 වටිනා ප්‍රසම්පාදනයන් අවසන් වී නොතිබුණි. | ආයතනයේ අභ්‍යන්තර පාලනය නිවැරදි කිරීම පිණිස අවශ්‍ය නිසි පාලන ක්‍රමයක් හඳුන්වා දීමට කටයුතු යොදන අතර මෙම දූර්වලතාවයන් මඟ හරවා ගැනීම පිණිස SARASA මෘදුකාංගය භාවිත කිරීමට බලාපොරොත්තු වේ. | ආයතනයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රසම්පාදනයේ අරමුණු ඉටුවන පරිදි ක්‍රියාවට නැංවිය යුතුය. |

### 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය
--------------------------------------

### 4.1 සංයුක්ත සැලැස්ම
---------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛනයේ 5.1.3 ඡේදය ප්‍රකාරව වර්ෂ 03 කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර, එම සැලැස්ම වාර්ෂිකව යාවත්කාලීන කර කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබාගෙන, සෑම වර්ෂයක් ආරම්භ වීමට අවම වශයෙන් දින 15 කට පෙර විගණකාධිපති, භාණ්ඩාගාරය, රේඛීය අමාත්‍යාංශය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ජාතික මූලික අධ්‍යයන ආයතනය ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අදාළ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුකූලව වසර 05 ක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | අදාළ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු අතර ඒවා ඵලදායී පාලන කාරක ලෙස යොදා ගත යුතුය. |

## 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආයතනයේ සමස්ථ අරමුණු ඉටු කර ගැනීමට අදාළව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වුවත්, ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම පර්යේෂණ ව්‍යාපෘතීන් සඳහා පමණක් පිළියෙල කර තිබුණි. | ආයතනයේ සමස්ථ අරමුණු ඉටු කර ගත හැකි පරිදි අදාල වර්ෂය සඳහා ප්‍රධාන කාර්ය සාධන දර්ශක ඇතුළත් කර වසරේ ක්‍රියාකාරී සැලැස්ම 2019 වර්ෂයේ සිට පිළියෙල කිරීමට කටයුතු යොදා ඇත. | අදාළ නෛතික විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු අතර ඒවා ඵලදායී පාලන කාරක ලෙස යොදා ගත යුතුය |

## 4.3 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ජාතික මූලික අධ්‍යයන ආයතනයේ වාර්ෂික පර්යේෂණ සමාලෝචනය (Annual Review) සඳහා රැස් කරන ලද රු.1,122,500 ක ආදායම අයවැය ලේඛනය තුළ හඳුනාගෙන නොතිබුණි. | 2018 වර්ෂයේ වාර්ෂික පර්යේෂණ සමාලෝචනය සඳහා බාහිර පාර්ශවයන්ගෙන් ලැබෙන මුදල් නිශ්චිතව තීරණය කරගත නොහැකි නිසාත්, එහි වන ඉතිරිය ඊළඟ වසර සඳහා යොදා ගන්නා බැවිනුත්, වාර්ෂික අයවැය ලේඛනයේ ඇතුළත් කර නොමැත. | වර්ෂයට අදාළ ප්‍රමාණාත්මක ආදායම් හඳුනාගෙන අයවැය ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ආයතනයේ අයවැය 2018 දෙසැම්බර් 29 දින සංශෝධනය කර තිබූ බැවින්, රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ 2003 ජූනි 02 දිනැති PED/12 චක්‍රලේඛයේ 5.2.5 වගන්තියට අනුකූල වන පරිදි 2018 වර්ෂයේ අයවැය සඵල මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි. | 2018 වර්ෂය සඳහා ආයතනයේ පුනරාවර්තන වියදම් වෙනුවෙන් රු. මිලියන 185ක මුදලක් අනුමත කර තිබුනද, මෙහෙයුම් කටයුතුවලදී අත්‍යාවශ්‍ය වියදම් සිදු කිරීම පිණිස F.R. 66 මගින් තවත් රු. මිලියන 10ක මුදලක් ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් පුනරාවර්තන වියදම් සඳහා 2018 නොවැම්බර් මාසය තුලදී මුදාහරින ලදී. ඒ අනුව සකස් කරන ලද සංශෝධිත අයවැය අනුමැතිය සඳහා ඊට ආසන්නයේම, 2018 වසරේ දෙසැම්බර් මස පැවැත්වූ පාලක මණ්ඩලයට යොමු කර අනුමැතිය ලබා ගන්නා ලදී. | වර්ෂයේ අයවැය සඵල මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගත යුතුය. |